ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-06-07 |

පැමිණිලි පාර්ශවය : එස්.ජී. විජයකෝන් මිය ඇතුළු පිරිස,
389/එෆ්, ඊරියගම,
පේරාදෙණිය.

වගඋත්තර පාරශවය : 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

02 අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : එච්ආර්සී/71/21**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම**

ඉහත පැමිණිලිකාරිය ඇතුළු පැමිතිලිකරුවන් 07 දෙනෙකු විසින් 2021-01-10 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සිය ලිඛිත පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ තමන් සියලු දෙනා ජාතික පාසල් වල සේවය කරමින් සිටින බවත් එම පාසල් වල සේවා කාලය වසර 3 ක් සම්පූර්ණ කර ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් ජාතික පාසල් වලට ඇතුලත් කිරීම සඳහා අධ්‍යාපන ලේකම්වරයාගේ අත්සනින් යුතුව 2019 වසරේ අනුමැතිය ලබා දී තිබූ බවත් පසුව ශ්‍රී ලංකාවේ ඇතිවූ දේශපාලන වෙනස්වීම් හේතුවෙන් අදාළ දරුවන් ඇතුලත් කර ගැනීම නතර කර තිබූ බවත් ඒ අතරතුර ඉහත තීරණය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ජාතික පාසල් කිහිපයකට දරුවන් ඇතුලත් කර ගැනීමට කටයුතු කර තිබූ බවත් මේ තත්වය තුළ තම දරුවන් කලින් අධ්‍යාපනය ලබමින් සිටි ජාතික පාසල් වලින් ඉවත් කරගෙන තිබූ අතර ඔවුන්ට වෙනත් ජාතික පාසල් ලබාදීමට කටයුතු කර තිබූ බවද පවසයි. 2020-11-15 දිනට පෙර තම දරුවන් අදාළ ජාතික පාසල් වලට ඇතුලත් කර ගනනා බවට අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් ප්‍රකාශ කර තිබුණත් 2021 ජනවාරි මාසය වනතෙක්ම තම දරුවන් ඇතුලත් කර ගැනීමට කටයුතු කර නොමැති බවත් තම කණ්ඩායමේ එක් සාමාජිකාවකගේ දරුවෙකු මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට කටයුතු කර ඇති බවත් මෙම තත්වය තුළ තමන් අසමාන සැලකිල්ලකට සහ තම දරුවන්ගේ අයිතිවාසිකම් කඩවීමක් සිදුව ඇති බව සඳහන් කරමින් මේ සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවයන් කැඳවා කඩිනම් විමර්ශනයක් සිදු කර තම දරුවන් අදාළ ජාතික පාසල් වලට ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටී.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail — sechrcsl@gmail.com

### වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම

මෙම පැමිණිල්ලට අදාලව ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් 2021-02-14 දාතමින් වාර්තා කැදවීමක් සිදු කර ඇති අතර 2021-04-09 දාතමින් ඊට පිළිතුරු ලබාදී ඇති සහකාර ලේකම් කේ.එච්.එස්.ඩී. පද්මසිරි මහතා (අධ්‍යාපන ලේකම් වෙනුවට) ප්‍රකාශ කර ඇත්තේ 2019-11-16 දින පැවති ජනාධිපතිවරණ ඡන්ද විමසීම සිදු කෙරුනු බැවින් ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත් කර සතියක් ගතවනතුරු පැමිණිලි පාර්ශවය සදහන් කරන ආකාරයට ජාතික පාසල් වලට දරුවන් ඇතුලත් කිරීම තාවකාලිකව අත්හිටුවන ලෙස මැතිවරණ කොමිසම විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර ඇති බවත් ඒ අනුව පැමිණිලි පාර්ශවය ඇතුළු තවත් ගුරු භවතුන්ගේ දරුවන් ජාතික පාසල් වලට ඇතුලත් කිරීම සදහා ඉඩකඩ සලසා දීමට අවස්ථාවක් නොවූ බවත් මැතිවරණ කොමිෂන් සභාවේ නියෝගය ලිපියක් මගින් පාසල් වලට දැනුම් දීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින් පාසල් වල විදුහල්පතිවරුන් වෙත දුරකථනය මගින් මෙම තත්වය දැන්වීමට කටයුතු කළබව සඳහන් කරයි.

කෙසේ වෙතත් එම කාලවකවානුවේ ජාතික පාසල් වලට සිසුන් ඇතුලත් කිරීම ඉහත තත්වය යටතේ සිදු නොකෙරුනද ඉදිරිපත් වූ අභියාචනා සලකා බලා දරුවන් ඇතුලත් කළ අවස්ථා ද පවතින බව සඳහන් කර ඇත. 2020-01-31 දිනට ජාතික පාසල් වල වසර 3 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල වල සාමාජිකයින්ගේ දරුවන් ඔහු හෝ ඇය සේවය කරන එම පාසලටම ඇතුලත් කිරීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ගේ තොරතුරු කැඳවා එම නිලධාරීන්ට ලිපි නිකුත් කිරීම 2020 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද බවද එම කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කොට ඇත.

### විමර්ශනය

මෙම පැමිණිල්ලට අදාලව පාර්ශවකරුවන් කැඳවා 2022-02-10 දින කැඳවා තිබූ පරීක්ෂණය සඳහා පැමිණිලි පාර්ශවය සහ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.සී. පලාවෙල මිය සහභාගි වී ඇත. එහිදී පැමිණිලි පාර්ශවයට පැමිණිල්ලේ විෂයගත කාරණය සම්බන්ධව කඩිනමින් සහනයක් සලසාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අධ්‍යාපන ලේකම්වරයා ඇතුළු අමාත්‍යාංශ ඉහල නිලධාරීන්ගේ අවධානය යොමු කරවන ලෙස පරීක්ෂණ නිලධාරි උපදෙස් ලබාදී ඇත. තවද ඒ සම්බන්ධයෙන් සුදුසු කටයුතු සිදු කර දින 07 ක් තුළ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් ලබාදෙන ලෙසද එහිදී වැඩිදුරටත් උපදෙස් ලබාදී ඇත. ඒ සඳහා වගඋත්තරකාර පාර්ශවය එකගතාවය පල කරමින් කටයුතු කර ඇතත් ඒ අනුව කටයුතු සිදු නොවූ බවට පැමිණිලි පාර්ශවය දුරකථනය මගින් කොමිෂන් සභාව වෙත අවස්ථා කිහිපයකදී තම දුක්ගැනවිලි ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් මෙම පැමිණිල්ල සම්බන්ධ සිදු කරන විමර්ශනයේදී පැමිණිලිකරුවන්ට සිය දරුවන් තමන් සේවය කරන පාසලේ හෝ ආසන්න පාසලකට ඇතුලත් කර අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යෑම සඳහා නීත්‍යානුකූල හිමිකමක් පැවතියේද යන්න සලකා බැලීමේදී 2019-04-08 දිනැතිව එවකට ජාතික පාසල් අධ්‍යක්ෂවරයා විසින් සියලුම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති අංක ED/1/6/14/AD/2019 අංක දරණ " ජාතික පාසල් වල සේවා කාලය වසර 3 ක් සම්පූර්ණ කරන ලද අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ දරුවන් ජාතික පාසල් වලට ඇතුලත් කිරීම - 2019 (1, 5, 6 හා 11 ශ්‍රේණි හැර)" යන ශීර්ෂය යටතේ සියලුම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් වෙත යොමු කර ඇති බව අනාවරණය වන අතර එමගින් අදාළ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ තොරතුරු ආකෘති පත්‍ර දෙකක් මගින් 2019-04-30 දිනට පෙර ලබා දෙන ලෙස දන්වා ඇති බව නිරීක්ෂණය වේ. (පිටු අංක 2) මීට අමතරව අධ්‍යාපන ලේකම්වරයා විසින් ඉහත ලිපිය පරිදි දරුවන් ඇතුලත් කිරීමට අදාළ ජාතික පාසල් කිහිපයකම විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපි කිහිපයක පිටපත් ද පැමිණිලි පාර්ශවය විසින් සිය පැමිණිල්ල සමග ඉදිරිපත් කර ඇති අතර පිටු අංක 5, 6, 7, 8, 9, 10, 11, 12 මගින් එම ලිපි වල පිටපත් ඉදිරිපත් කර ඇත. මෙම කාරණය සම්බන්ධව පැමිණිලිකරුවන් විසින් එවකට අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා, ජනාධිපතිවරයා ඇතුළු පාර්ශවයන් කිහිපයක් වෙතම තම

අභියාචනා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙහිදී පැමිණිලි පාර්ශවය වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ තමන් සේවය කරන ජාතික පාසල හෝ ආසන්නතම ජාතික පාසලක් වෙත තම දරුවන් ඇතුලත් කර ගැනීම සඳහා විදුහල්පතිවරුන්ගේ නිර්දේශය සහිතව අදාල අයදුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇතත් තමන්ගේ දරුවන් පැමිණිල්ල ඉදිරිපත් කරන දින වනවිටත් සහ අදාළ පරීක්ෂණය පවත්වා ඇති 2022-02-10 දින වන තෙක්ම එම ජාතික පාසල් වෙත ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දී නොමැති බවයි.

### නිරීක්ෂණ

මෙම පැමිණිල්ලට අදාලව පැමිණිලි පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

- ජාතික පාසල් වල සේවා කාලය වසර 3 ක් සම්පූර්ණ කර ඇති අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල වල සාමාජිකයින්ගේ දරුවන් ඔවුන් සේවය කරන ජාතික පාසලට ඇතුලත් කිරීම සඳහා 2019-04-08 දාතමින් අධ්‍යාපන ලේකම් වෙනුවට එවකට ජාතික පාසල් අධ්‍යක්ෂවරයා විසින් සියලුම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් වෙත ලිපියක් මගින් දැන්වීමක් සිදු කර ඇති බව.

- එම ලිපියේ අන්තර්ගතය පරිදි අදාල විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අදාල ගුරු භවතුන්ගේ සහ දරුවන්ගේ විස්තර යොමු කිරීමෙන් අනතුරුව එවකට අධ්‍යාපන ලේකම් එම්. රණසිංහ මහතා විසින් " ජාතික පාසල් වල සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ දරුවන් ජාතික පාසල් වලට ඇතුලත් කිරීම - 2019 " යන ශීර්ෂය යටතේ දිවයිනේ ප්‍රමුඛ ජාතික පාසල් කිහිපයකම විදුහල්පතිවරුන් වෙත දරුවන් කිහිප දෙනෙකු ඇතුලත් කිරීම සඳහා ලිපි නිකුත් කර උපදෙස් ලබාදී ඇති බව.

- 2019-10-24 දාතමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ, ජාතික පාසල් වෙත ජනාධිපතිවරණය - 2019 " ඡන්ද විමසීම් කාලය තුළ දේශපාලනමය ප්‍රචාරණ කටයුතු සඳහා ජාතික පාසල් තුළ අතරමැදි පංති සඳහා දරුවන් ඇතුලත් කිරීම සිදු කරන බවට ලැබෙන පැමිණිලි සම්බන්ධවයි " යන ශීර්ෂය යටතේ නිකුත් කර ඇති නියෝගය මගින් ජනාධිපතිවරණය පවත්වා සතියක් ඉක්ම යන තෙක් එම දරුවන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවන ලෙස නියෝග කර ඇති බව.

### නිගමනය

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කර ඇති විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ගනු ලැබූ තීරණයක් අනුව ජාතික පාසල් වල වසර 3 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල වල සාමාජිකයින්ගේ දරුවන් එම පාසලේම හෝ ආසන්න ජාතික පාසල් වලට ඇතුලත් කර ගැනීම සඳහා අවස්ථාව සලසා දී ඇති අතර එම ක්‍රියාවලිය දේශපාලනීකරණය වී ඇති බවට සහ ඒ හේතුවෙන් එම කටයුතු ජනාධිපතිවරණය පවත්වා සතියක් ගතවනතුරු අත්හිටුවන ලෙස 2019-10-24 දිනැති ලිපියක් මගින් මැතිවරණ කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා ඇති තත්වය තුළ එම ක්‍රියාවලිය නතර කර ඇතත් පැමිණිලි පාර්ශවය හැර වෙනත් දරුවන් ජාතික පාසල් වලට ඇතුලත්ව ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනෙක් අතට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැමිණිලිකරුවන්ගේ දරුවන් ඔවුන් සේවය කරන ජාතික පාසල් හෝ ආසන්න ජාතික පාසල් වලට ඇතුලත් කර ගැනීමට සුදුසුකම් නොලබන බවට හෝ ඇතුලත් කර නොගන්නා බවට හෝ ඔවුන්ව දැන්වත් කර නොමැත. ඒ අනුව අධ්‍යාපන ලේකම් වෙනුවට එවකට ජාතික පාසල් අධ්‍යක්ෂ කේ.ජී. පුන්‍යදාස මහතා විසින් 2019-04-08 දාතමින් සියලුම ජාතික පාසල් වල

විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපිය පරිදි සහ එහි අන්තර්ගතය පරිදි පැමිණිලිකරුවන් තම දරුවන් තමන් සේවය කරන ජාතික පාසල හෝ ආසන්න ජාතික පාසලක් වෙත ඇතුලත් කිරීමට විදුහල්පතිවරුන් වෙත ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍ර සම්බන්ධයෙන් සලකා නොබලමින් කටයුතු කිරීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් සහතික කර දී ඇති නීතිය ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණය සර්ව සාධාරණ වියයුතුය යන මූලික අයිතිවාසිකම කඩවී ඇති බවට නිගමනය කරමි.

**නිර්දේශය**

ඉහත නිගමනය පරිදි මෙම පැමිණිල්ලේ පාර්ශවකරුවන් වන

ජ්. විජයකොන් මහත්මිය - ටී.එම්. තෙනුම් මෛත්‍රුලි විජයකෝන්, පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර 2022 වසර 10 ශ්‍රේණිය

එන්.ජ්.එම්.ජ්. සෙනෙවිරත්න මයා - එන්.ජ්.එම්. වත්සලා කුමාරි සෙනෙවිරත්න, උසස් බාලිකා විද්‍යාලය මහනුවර, 2022 වසර 6 ශ්‍රේණිය

ධම්මික වසන්ත කුමාර මයා - එච්.කේ. සත්මි සුහන්සා, සුජාතා බාලිකා විද්‍යාලය මාතර 2022 5 ශ්‍රේණිය

ජේ.කේ.ජ්. අමිල ප්‍රභාෂ් චාමර මයා - ජේ.කේ.ජ්. දුලිති දිසේජා, සුජාතා බාලිකා විද්‍යාලය මාතර, 2022 5 ශ්‍රේණිය

එස්.පී. උයන්ගොඩ මයා - විමන්දා නවනි උයන්ගොඩ, සුජාතා බාලිකා විද්‍යාලය මාතර 2022 5 ශ්‍රේණිය

ටී.එන්.කේ. දිසානායක මිය - දිනෙත් ඉඳුවර මල්ලව ආරච්චි, කිංස්වුඩ් විද්‍යාලය මහනුවර 2022 5 ශ්‍රේණිය

ආර්.එම්.අයි.කේ. රත්නායක මිය - ඩී.එම්. කුලන්සා පමෝදි දිසානායක, මහාමායා විද්‍යාලය මහනුවර 2022 5 ශ්‍රේණිය

පී.එස්. පතිරන මිය - ජේ.ජ්.කේ. සසුමි දුල්ශානි, උසස් බාලිකා විද්‍යාලය මහනුවර, 2022 5 ශ්‍රේණිය

යන අයගේ ඉහත නම් සඳහන් දරුවන් අදාළ පාසල් වෙත ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් ඉහතපාසල් වල විදුහල්පතිවරුන් වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 07.07 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රේ/-

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)

Dr. M.H. Nimal Karunasiri
Commissioner